2019/12/26






# 2019 නොවැම්බර් උද්ධමනය 4.1%යි

චමිල පෙරේරා

2019 නොවැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 4.1%ක් බව ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි.

2019 ඔක්තෝබර් මාසයේ පැවති 5.6% සිට නොවැම්බර් මාසයේදී 4.1%ක් දක්වා උද්ධමනය පහළ ගොස් ඇති අතර, 2018 නොවැම්බර් මාසයේ පැවති ඉහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා දායක වී ඇත.

මේ අතර ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2019 ඔක්තෝබර් මාසයේ පැවති 7.3% සිට නොවැම්බර් මාසයේදී 4.0% දක්වා සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2019 ඔක්තෝබර් මාසයේ පැවති 4.3% සිට නොවැම්බර් මාසයේදී 4.2% දක්වා දක්වා සුළු වශයෙන් පහළ ගොස් තිබේ.

එමෙන්ම වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස 2019 ඔක්තෝබර් මාසයේ පැවති 2.8% සිට නොවැම්බර් මාසයේදී 3.0% දක්වා ඉහළ ගොස් ඇත.